# සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ ආමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## 2017 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

## භාණ්ඩ හා සේවා (මිල සැදහුම් ක්‍රමය)

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත, පහත සදහන් භාණ්ඩ හා සේවා 2017 වර්ෂය සඳහා සැපයීම සඳහා පිළිගත් නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ පත්කළ නියෝජිතයින්, බලයලත් අලෙවිකරුවන් සහ සේවා සපයන්නන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අයිතමය | ප්‍රවර්ගය (භාණ්ඩ) | විස්තරය |
|---|---|---|
| 01. | පරිගණක මුද්‍රණ කඩදාසි | පරිගණක පත්‍රිකා, හර පත්‍රිකා හා අවසර පත්‍ර |
| 02. | පරිගණක ප්‍රින්ටර් හා උපාංග | ලැප් ටොප්, ඩෙස්ක් ටොප් පරිගණක, ප්‍රින්ටර්ස් හා UPS ඒකක |
| 03. | පරිගණක ජාල | පරිගණක ජාල උපකරණ හා උපාංග |
| 04. | විදුලි උපාංග | බොයිලේරු, එක්ස්ටෙන්ෂන් කෝඩ්, විදුලි බල්බ, වයර්, වයරිං, ආම්පන්න, ස්වීච, කේබල් සහ විදුලි පංකා |
| 05. | හාඩ්වෙයාර් අයිතම | ජී අයි බට, පී වී සී බට, ඇලුමිනියම් උපාංග, ජල මීටර හා වැල් වර්ග |
| 06. | රසායනාගාර උපකරණ හා රසායන ද්‍රව්‍ය | ජලය, අපවිත්‍ර ජලය, වාතය හා අපද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා |
| 07. | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය | පෑන්, පැන්සල්, ලියුම් කවර, ජයා පිටපත් කඩදාසි, යතුරු ලියන කඩදාසි, බොක්ස් ෆයිල්, ෆයිල් කවර, ස්ටේප්ලර්, පන්චර්,ඇමුණුම් කටු, CR පොත් ප්ලාස්ටික ෆයිල් කවර හා අනෙකුත් ලිපි ද්‍රව්‍ය වර්ග |
| 08. | කාර්යාලීය ගෘහ භාණ්ඩ (වානේ / දැව / ප්ලාස්ටික් / පදම් කල දැව) | අල්මාරි, පුටු, කැබිනට්, කබඩ්, රාක්ක හා කාර්යාලීය මේස |
| 09. | කාර්යාලීය උපකරණ | ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මුදල් ගණින යන්ත්‍ර, මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර්, බයින්ඩින් මැෂින්, ෆැන්කින් මැෂින් හා කඩදාසි කැපීමේ යන්ත්‍ර |
| 10. | කාර්යාලීය මුද්‍රා | පොලිමර්, තීන්ත පුරවන ලද මුද්‍රා හා දින මුද්‍රා |
| 11 | මුද්‍රණ කටයුතු | කුඩා පොත්, අත් පොත්, පොත් පිංච, දින පොත්, පත්‍රිකා, පුවත් පත්‍රිකා, සඟරා, ඩොකට්ස්, කොන්කර් කඩදාසි ලිපි ශීර්ෂ, නාම පත්‍රිකා, අවසර පත්‍ර, ඇතුලු වීමේ අවසර පත්‍ර,රෙජිස්ටර, මුද්‍රිත ලියුම් කවර, N C R කඩදාසි, මුද්‍රන පත් සහ ෆයිල් කවර |
| 12 | නිල ඇඳුම් රෙදි | කමිස, කලිසම් සහ නිල ඇඳුම් උපාංග |
| **අයිතමය** | **ප්‍රවර්ගය (සේවා)** | **විස්තරය** |
| 13 | ඇඳුම් මැසීම | කමිස සහ කලිසම් |
| 14 | පරිගණක, ප්‍රින්ටර්ස් සහ උපාංග සඳහා සේවා සැපයීම් සහ අලුතුවැඩියා කටයුතු | ලැප්ටොප් සහ ඩෙක්ස්ටොප් පරිගණක, ප්‍රින්ටර්ස්, ස්විචර්ස්, ස(ර්)වර්, 6KVA UPS ඒකකය සහ පරිගණක මෘදුකාංග |

අයිතම අංක 02,03, 06 සහ 09 සඳහා තමන්ගේ අදාළ ක්ෂේත්‍රයන්හි අවම වශයෙන් වසර තුනක් මෙහෙයුම් කටයුතු සිදු කොට ඇති නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ පත්කළ නියෝජිතයින්, බලයලත් අලෙවිකරුවන් සහ සේවා සපයන්නන්, සැපයුම්කරුවන් ලියාපදිංචිය සඳහා වන අයදුම්පත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අන්තරජාලයෙන් (www.investsrilanka.com) බාගත කරගැනීම හෝ කොළඹ 01, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 09 වන මහලේ සැපයුම් අංශයෙන් 2016 නොවැම්බර් 30 වන දින දක්වා ලබා ගත හැක.

නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ පත්කළ නියෝජිතයින්, බලයලත් අලෙවිකරුවන් සහ සේවා සපයන්නන් අවශ්‍ය වෙතොත් ණය පදනම යටතේ සිය සේවාවාන් ලබාදීමට හැකි තත්වයක සිටිය යුතු අතර එම කාලය අවම වශයෙන් මාසයකි.

එක් එක් ප්‍රවර්ගය සඳහා ලියාපදිංචි ගාස්තු වශයෙන් ආපසු ගෙවනු නොලබන රුපියල් 1,000/- ක් වැට් බදු සමඟ ගෙවිය යුතුය. අදාළ ගෙවීම් කොළඹ 01, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 08 වන මහලේ, මුදල් දෙපාර්තමේන්තුවේ, සරප් වෙත මුදලින් කළ හැක. චෙක්පත් බාර ගනු නොලැබේ.

අයදුම්පත් හා ලදුපත බහාලූ කවර "**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2017**" යනුවෙන් වම් ඉහළ කෙළවරේ සඳහන් කොට, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගබඩා හා සැපයුම්), පරිපාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 09 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ලිපිනයට 2016 නොවැම්බර් මස 01 වන දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කල යුතුය.

**සභාපති**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**
**26 වන මහල, බටහිර කුළුණ,**
**ලෝක වෙළඳ මධ්‍යස්ථානය,**
**කොළඹ 01**